# ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

**අංක 14,856/5 — 1969 ජුනි 1 වැනි ඉරිදා — 1969.6.1**

**(ආණ්ඩුවේ බලය පිට ප්‍රසිද්ධ කරන ලදී)**


# III වැනි කොටස — ඉඩම්

(වෙන වෙනම ගොනුකර ගත හැකි පරිදි සෑම කොටසකටම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත.)

## ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම්

### 1964 අංක 28 දරණ ඉඩම් අත්කර ගැනීමේ (සංශෝධන) පනතින් සංශෝධිත පරිදි ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)

38 වෙනි වගන්තිය (අ) අනුරු විධානය යටතේ ආඥාව

1969 අංක 144 දරණ ආඥාව

ජේ. 67/68 ආර්. 529.

යොමු අංකය :——————

කිව්. අයි/141.

1964 අංක 28 දරණ ඉඩම් අත්කර ගැනීමේ (සංශෝධන) පනතින් සංශෝධිත පරිදි ඉඩම් අත්කර ගැනීමේ පනතේ (460 වැනි පරිච්ඡේදය) 38 වෙනි වගන්තියේ (අ) අනුරු විධානයෙන් මා වෙත පවරා ඇති බලතල අනුව, ඉඩම්, වාරිමාර්ග හා විදුලිබල ඇමති චාර්ල්ස් පර්සිවල් ද සිල්වා වන මම, පහත සඳහන් උපලේඛනයෙ I වෙනි තීරයේ සඳහන් ඉඩම් අත්කර ගැනීමේ නිලධාරියාට නැත හොත් එකී නිලධාරියා විසින් ඒ සඳහා බලය දෙන ලද වෙනත් නිලධාරියාට, එම උපලේඛනයේ II වෙනි තීරයේ අනුරූප යටහනේ දක්වෙන නියමිත ඉඩම ස්වාමිත්වයට ගැනීමට මෙයින් නියම කරමි

සී. පී. ද සිල්වා,
ඉඩම්, වාරිමාර්ග හා විදුලිබල ඇමති.

1969 මැයි මස 26 වෙනි ද,
කොළඹ.

**උපලේඛනය**

| I<br>ඉඩම් අත්කර ගැනීමේ නිලධාරියා | II<br>ඉඩමේ විස්තරය |
|---|---|
| කොළඹ දිස්ත්‍රික්කයේ උප දිසාපති | කොළඹ දිස්ත්‍රික්කයේ, කොළඹ ප්‍රාදේශීය ආදායම් නිලධාරි කොට්ඨාශයේ, කොළඹ මහ නගර සභා සීමාව තුළ, අංක 37 දරණ කොල්ලුපිටිය කොට්ඨාශයේ, කොල්ලුපිටිය ගමේ, කොල්ලුපිටිය පාරේ වරිපනම් අංක 77, 81 හා 83 දරණ අක්කර 5, රූඩ් 3, පර්චස් 30.75ක් විශාල වූ පහත සඳහන් මායිම් තුළවූ ඉඩම :—<br>උතුරට : කොල්ලුපිටිය පාරේ වරිපනම් අංක 73, 73/1 හා 73/1ඒ දරණ ශාන්ත ඇන්ඩෲස් ස්කොච් පල්ලියේ භාරකරු හිමිකම් කියන ඉඩම ;<br>නැගෙනහිරට : පාරක් සඳහා වෙන් කර ඇති බිම් කොටස ;<br>දකුණට : කොල්ලුපිටිය පාරේ වරිපනම් අංක 89 හා 89/1 දරණ කොළඹ අග්‍රරාජගුරු ප්‍රසාදීන් වහන්සේ හිමිකම් කියන ඉඩම ;<br>බස්නාහිරට : කොල්ලුපිටිය පාර. |




ලංකාණ්ඩුවේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රිතයි

350/1——ජේ 3949—5,600 (69/6)